# කන්ද උඩරට නායක්කර් රජ පෙළපතින් සිදු වූ ශාසනික මෙහෙවර

ක්‍රි. පූ. 543 දී ලක්දිවට ගොඩබට විජය කුමරුගෙන් පසු ලක්දිව රාජාවලිය ඇතිවිය[1] ලක්දිව මුල් ම රාජධානිය තම්මැන්නා නුවර වුවත් ක්‍රි. පූ. 437 දී පණ්ඩුකාභය කුමරා 'අනුරාධපුරය' රාජධානිය කරගෙන රාජ්‍ය ගෙන යාමත් සමග ම ලක්දිව රජ කෙනෙකු ගොඩනැගූ ප්‍රථම රාජධානිය එය විය[2] ඒ අනුව එයින් පසු ලක්දිව සිංහල රාජධානි ක්‍රමය ආරම්භ වූණි. මෙය අනුරාධපුර, පොළොන්නරු, දඹදෙණි ආදි රාජධානි පැවතුණ යුගයන්හි බොහෝ සෙයින් දක්නට ලැබුණ අතර ඇතැම් කාලවලදී නොයෙක් විදේශීය මෙන් ම දේශිය වශයෙන් ද ඇති වුණ ආක්‍රමණ හේතුවෙන් යම් පසුබෑමකට ලක් වූ බව ඉතිහාසාගත තොරතුරු ආශ්‍රයෙන් දැක ගත හැකිය. මෙයින් වැඩි ම විනාශයක් ඇති වී තිබෙන්නේ කාලිංග මාඝ[3] හා පෘතුගීසීන් විසින්[4] ලක්දිව ආක්‍රමණය කරන ලද අවස්ථාවන්හි දී ය. මෙසේ යම් යම් බාධක මධ්‍යයේ වුව ද ලක් රාජ්‍යයෙහි සිංහල රාජ පරම්පරාව සෙංකඩගල සමය දක්වා අඛණ්ඩව පැවතගෙන ආවේය.

එහෙත් සිංහල රාජ පරම්පරාවේ සිහසුනට පත් වීමට කන්ද උඩරට සෙංකඩගල රාජ්‍යය ගෙනගිය වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ නම් සිංහල රජතුමාට පුත් කුමරුවෙක් නොවූ නිසා රජකමට සුදුස්සෙකු වශයෙන් පත්කරගෙන ඇත්තේ වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාගේ බිසවගේ සොහොයුරාය. කෝට්ටේ යුගයේ පටන් ඇතැම් රජවරු තම අග මෙහෙසිය වශයෙන් තෝරා ගත්තේ දකුණු ඉන්දියවේ සොළී, පාණ්ඩ්‍ය හා කළිඟු රටවලින් රැගෙන ආ කුමාරිකාවන්ය. සෙනරත් රජු තම පළමු බිරියගේ අභාවයෙන් පසු මධුරා පුරයේ නායක්කර් වංශයේ කුමරියක සරණ පාවා ගත්තේය. ඉන්පසු සිටි රජවරු කිහිප දෙනෙක් ම මෙම ක්‍රියා පිළිවෙත අනුගමනය කළහ. මීට හේතු වී ඇත්තේ ඉන්දියාව සමග සමීප සම්බන්ධතාවයක් ගොඩ නගා ගැනීම අපේක්ෂා කළ නිසා විය හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිංහල රජුගේ අභාවයෙන් රජකම හිමිවූයේ නායක්කර් දේශයෙන් ගෙනා ඔහුගේ බිසවට ය. එහෙත් නායක්කර් නීතිය අනුව බිසවගේ නෑකමින් ඇගේ සොහොයුරාට ස්වාමියාගේ රාජ්‍යය හිමිවිය යුතුය.[5]

ඒ අනුව රාජ්‍යයට පත් වූ පළමු නායක්කර් වංශික තැනැත්තා විජය ශ්‍රී රාජසිංහ (ක්‍රි. ව. 1739 - 1747) යනුවෙන් නම් තබා ගැණින. මොහු රාජ්‍යයට පත් කරලීම සඳහා මූලිකව ක්‍රියා කොට ඇත්තේ ඇහැලේපොල මහ අදිකාරම් තැන හා වැලිවිට සරණංකර මාහිමියන්ය.[6] මොහු අභිෂේකයට පත් වී ඇත්තේ ද තමන්ගේ පාරම්පරික හින්දු සමය අත්හැර බුදුසමය වැළඳගෙන සිංහල රාජ සිරිත් අනුවය. මීට හේතු වී ඇත්තේ රටේ රජු බුද්ධාගම කෙරෙහි ඇල්මක් ඇති තැනැත්තෙකු වීම රාජ්‍යයට පත්වීමට ප්‍රධාන සුදුසුකමක් ලෙස සැලකූ නිසාය.[7] එහෙත් තමන්ගේ භාර්යාව ලෙස තෝරා ගත්තේ නායක්කර් වංශයේ ම කුමාරිකාවක් ය.[8] මෙතුමා බුදුසමය වැළඳගත් නිසා දළදා වහන්සේ උදෙසා මෙන් ම අනෙකුත් වෙහෙර විහාරස්ථාන ද ප්‍රතිසංස්කරණය කොට නොයෙක් පුද පූජා පැවැත් වූ අයුරු මහාවංසයෙහි දීර්ඝ වශයෙන් විස්තර කෙරී ඇත. දළදා වහන්සේ හැරුණු කොට අලු ලෙණෙහි ඇති පිළිම ගෙය ප්‍රතිසංස්කරණය කිරීම, සුමනකූට පර්වතයට දැක්විය යුතු පූදපූජා පැවැත්වීම ආදිය මෙතුමාගේ කාර්යයන් අතර විශේෂ තැනක් ගනියි.[9] පහන් පූජාවෙහි ආනිශංස අසා දැනගත් රජු ශ්‍රී දන්තධාතු මන්දිරය ඇතුළු ලක්දිව සියලු විහාරස්ථානවල එක්දිනක් පහන්

දැල්වීම කොට පූජාවක් කරන ලෙස නියෝග කොට ඇත.[10] දළදා වහන්සේ උදෙසා රියන් දෙක හමාරක් උසැති කරඬුවක් සෑදීමට ආරම්භ කළත් එය සිදු කිරීමට ඔහුට නොහැකි වූයේ රාජ්‍යාභිෂේකයෙන් අටවෙනි වර්ෂයේ දී මෙතුමාගේ අභාවය සිදු වූ නිසාය.

ශාසනික වශයෙන් ඉටුකළ තවත් කාර්යයක් වන්නේ මෙතුමාගේ කාලයේ දෙවරක් ම උපසම්පදාව ගෙන ඒමට කටයුතු කිරීමය. මේ රජුගේ කාලයේ දී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් ඉටු කරවා ගැනීමට නොහැකි වූ කාර්ය ඉටු කර ගැනීමට සරණංකර මාහිමියන් ඉටා ගත්තේය. ඊට පූර්ණ අනුග්‍රහය දැක් වූ රජතුමා ලන්දේසීන්ගෙන් නැව් ඉල්වාගෙන පළමුවැනි වරට සියම් දේශයට දූත පිරිසක් පිටත් කර හැරියේය. එහෙත් අතරමග දී කුණාටුවකට හසු වූ නැව මුහුදු බත් විය. දෙවෙනි වර ද දූත පිරිසක් මගින් උපසම්පදාව රැගෙන ඒමට පිටත් කර යැවුවත් මොහුගේ අභාවය සිදු වූ නිසා එය ද කළ නොහැකි විය. එම දූත පිරිස ද සියම් දේශයට ගොස් උපසම්පදාව රැගෙන ඒමට සියලු කටයුතු සංවිධානය කරමින් සිටින අවස්ථාවේ රජුගේ වියොව අසා අනික් රජුගේ කැමැත්තක් නැතිව උපසම්පදාව රැගෙන ඒමට නොහැකි නිසා පෙරළා පැමිණ තිබේ. ඔවුහු ද අතරමග දී කුණාටුවට හසු වී අතලොස්සක් පමණක් ඉතිරි වන්නට අනෙකුත් සියලු දෙනා මරු මුවට පත්වූහ. මෙම හේතූන් නිසා මේ රජුගේ කාලයේ උපසම්පදාව රැගෙන ඒමට නොහැකි වූණි.[11]

විජය ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු ලක්දිව රාජ්‍යයට පත්වූයේ ඔහුගේ බිසවගේ සහෝදරයාය. ඒ අනුව බොහෝ විට පිය පුතු පරම්පරාවෙන් පැවත ගෙන ආ ලක් රාජ්‍යය මස්සිනාගෙන් මස්සිනාට යන සම්ප්‍රදාය ඇති විය. ඔහු කීර්ති ශ්‍රී රාජසිංහ (ක්‍රි. ව. 1747 - 1780) නමින් රජවිය. මොහුගේ රාජ්‍ය වර්ෂය ලෙස මහාවංසයේ සඳහන් වන්නේ බුද්ධ වර්ෂයෙන් දෙදහස් දෙසිය අනූ වැන්නෙහි රාජ්‍යයට පත් වූ බවය.[12] එනම් ඉහත සඳහන් වූ වර්ෂයයි. මොහු කෝට්ටේ යුගයේ සිටි vi වන පරාක්‍රමබාහු රජුගෙන් පසු පහළ වූ ලක් රජුන් අතර සම්බුද්ධ සාසනයටත්, ධර්ම ශාස්ත්‍ර දෙකටත් හිතැතිව එහි උන්නතිය පිණිස කටයුතු කළ රජ වරුන් අතර අමරණීය රජෙකි. මන්දාරම් පුර පුවතෙහි විස්තර වන ආකාරයට මෙතුමා ශ්‍රී සරණංකර මාහිමියන්ගෙන් අක්ෂර, ශිල්ප ශාස්ත්‍ර, ඡන්දොලංකාර, අටුවා, ටීකා සහිත ත්‍රිපිටකය, වේද, නිඝණ්ඩු, නීති වැනි ශිල්ප ඉගෙනගෙන ඇත. එමනිසාම සරණංකර මාහිමියන්ට 'රාජගුරු' යන නාමය ද පිරි නමා ඇත.[13]

මොහු විසින් සිදු කරන ලද ප්‍රධානතම කාර්යය වූයේ නැති වී ගිය උපසම්පදාව ලක්දිව නැවත පිහිටුවීමය. ඒ සඳහා ඔහුගේ අධිෂ්ඨානය වූයේ ''මා දවස බුදු සසුන බබුළුවා ලන්නෙමි'' යන්නයි. ඒ අනුව බුද්ධගම නිරුපද්‍රිතව ඇත්තේ කුමන දේශයක දැයි දැන විචාරා සියම් දේශයට දූත පිරිසක් යවා ප්‍රවර උපාලි තෙරුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා 18 නමක් වඩම්මවාගෙන මල්වතු මහා විහාරයෙහි උපසම්පදා විනය කර්මය සිදු කොට උපසම්පදාව පිහිටුවීය.[14] මෙය ස්ථාවර පිහිටුවීමක් විය. එය අද දක්වා ම නොනැසී පවතින්නේ ඒ නිසාය. මේ හේතු නිසා සරණංකර මාහිමියන් පිළිබඳ ව කථා කරන සෑම අවස්ථාවක දී ම කීර්ති ශ්‍රී රාජසිංහ රජු පිළිබඳ ව අමතක කළ නොහැකිය. සියම් උපසම්පදාව පිහිටුවීම සම්බන්ධයෙන් රචනා කෙරී ඇති ස්‍යාමොපසම්පදාවත නම් කෘතියේ දී මෙතුමා විසින් සිදු කරන ලද ශාසනික මෙහෙවර මහත් අභිරුචියෙන් යුක්තව වර්ණනා කර ඇත.[15] මෙයින් පසුව ශාසනය චිරස්ථායි අන්දමින් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා සරණංකර මාහිමියන් උභය මහා විහාරයට (මල්වතු - අස්ගිරි) මෙන් ම ලක්දිව සියලු සංඝයාගේ නායකත්වය හිමිවන පරිදි සංඝරාජ පදවියට පත් කළේය.[16] එසේම උභය මහාවිහාරයේ දැන උගත් භික්ෂූන් අතරින්

තිබ්බටුවාවේ ශ්‍රී බුද්ධරක්ඛිත මාහිමියන්ට මල්වතු විහාරයේ මහානායක පදවියත් උරුලැවත්තේ ශ්‍රී ධම්මසිද්ධි මාහිමියන්ට අස්ගිරි මහාවිහාරයේ මහානායක පදවියත් පිළිබඳ අක්තපත්‍ර පිරිනමා ඇත.[17]

මොහුගේ කාලයේ ඇති වූ ශාසනික විපර්යාශයක් ලෙස පෙන්වා දිය හැක්කේ රජු බුදුදහම වැළඳ ගත්තත් ඔවුන්ගේ අග මෙහෙසින් ශිව දහම වැළඳගෙන ම සිටීමය. මේ නිසා විහාරස්ථානයක අනිවාර්ය අංගයක් බවට දේවාලය ද අඩංගු විය. එහෙත් නාථ විෂ්ණු, කතරගම හා පත්තිනි යන දේවාල සතර වික්‍රමබාහු රජුගේ කාලයේ පටන් ම තිබිණි. රජු දළදා වහන්සේ වැඳ පුදා ගන්නා අතර දේවිය දේවාලයට ගියාය. ඒ අනුව ලාංකිකයන් අතර සුළුවෙන් පැවති දේව විශ්වාසය වැඩි දියුණු වූයේ මේ කාල වකවානුවේය.[18]

මීට අමතර ව කෝට්ටේ යුගයේ සිටි ධර්මපාල රජු විසින් පෘතුගීසීන්ට පවරා දුන් සමන්තකූට පර්වතය සරණංකර මාහිමියන්ට තඹ සන්නසක් මගින් පවරා දුන්නේය.[19] පසුව මෙය වෙහැල්ලේ සංඝ පරම්පරාවට දුන් බව සඳහන් වේ.[20] එසේ ම මේ රජතුමා භික්ෂූන්ගේ විනයානුකූල පැවැත්ම උදෙසා මාර්ගෝපදේශයක් වශයෙන් කතිකාවතක් ද සකස් කරවා තැබීය.

මෙතුමාගේ කාලයේ සිදු වූ විනාශයක් වූයේ මුහුදුබඩ ප්‍රදේශවල නැංගුරම් ලා සිටි ලන්දේශීන් රට අභ්‍යන්තරයට පැමිණ රට අල්ලා ගන්නට සැරසීමය. මේ කාලවකවානුව වන විට ද ඔවුන් තමන්ගේ බලය මුහුදු සීමාවේ පිහිටුවාගෙන සිටියේය. එහෙත් 1763 දී මොවුන් මහනුවර නගරයට ඇතුල් වී නගරය විනාශ කළේය. ඒ අනුව මෙතෙක් කල් සමෘද්ධිමත් නගරයක් වශයෙන් පැවති මහනුවර නගරය විනාශයට පත්විය. රජු ද දන්තධාතූන් වහන්සේ, මෙහෙසිය හා නැගණිය රැගෙන හඟුරන්කෙත ප්‍රදේශයට ගොස් සැඟවී සිටියේය. එහිදී ද දළදා වහන්සේ කළයුතු වතාවත් ඒ ආකාරයෙන් ම සිදු කළ අතර දළදා පෙරහැරක්ද පවත්වා ඇත. එය වර්තමානය දක්වා ම වර්ෂයක් පාසා සිදු කරගෙන එනු ලබයි. නැවත උවදුරු අඩු වූ විට නගරයට පැමිණ රාජධානිය පිහිටුවීය. ලන්දේසීන් කළ විනාශය පිළිබඳ ව දීර්ඝ විස්තරයක් මහාවංසයෙහි සඳහන් වේ.[21]

මේ රජුගේ කාල පරිච්ඡේදය තුළ එනම් ක්‍රි. ව. 1753 සියම් දේශයේ සිට උපසම්පදාව රැගෙන ඒමෙන් අනතුරුව පැවති සිව් මහා දේවාලයන්හි පෙරහැර දැක දළදා වහන්සේ වෙනුවෙන් පෙරහැරක් නොපවත්වන්නේ කුමන හේතුවක් නිසා ද යන්න විචාරා සිව් දේවාලවල ඉදිරියෙන් ම දළදා පෙරහැර ගමන් කළයුතු  බව දන්වා ආඥාවක් නිකුත් කළේය.[22] ඒ අනුව ඉංග්‍රීසී ආණ්ඩු කාලයේ බොහෝ අවස්ථාවල දළදා පෙරහැර තහනම් කළත් අද දක්වා ම මෙය ද වාර්ෂිකව සිදු කරනු ලබයි. එය ''ඇසළ පෙරහැර'' මංගල්‍යය ලෙස හඳුන්වනු ලැබේ. අවුරුදු 35 ක් ලක් රාජ්‍යයේ නොමැකෙන නාමයක් සනිටුහන් කළ මෙම රජතුමා ක්‍රි. ව. 1780 දී මිය පරලොව ගොස් ඇත්තේ අසු පිටින් වැටීමෙන් බව එවකට සිවිල් නිලධාරියෙකු වශයෙන් සිටි කොඩ්රිංටන් මහතා සඳහන් කරයි.[23] එහෙත් මොහු මැරවීමට සිංහලයෝ නොයෙක් දෙනා උපක්‍රම යොදා ඇත. මොහු සිංහලයන්ගේ සිත්ගත් තැනැත්තෙක් වුවත් වඩුග පරපුරට කැමැත්තක් නොදක්වීය. විශේෂයෙන් ම මෙහි මූලිකත්වය ගන්නට ඇත්තේ පහතරට පුද්ගලයන් විසින් යැයි සැලකේ. ඒ මන්දයත් ඔවුන් රජුට කැමැත්තෙන් නොසිටි නිසාය.[24]

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පසු ඔහුගේ බිසවට සොහොයුරෙක් නොසිටි නිසා ඔහුගේ  ම සහෝදරයා රාජාධිරාජසිංහ (ක්‍රි. ව. 1781  - 1798) යන නමින් රාජ්‍යයට පතිවිය. කීර්ති ශ්‍රී රාජසිංහ

රජු විසින් කරවන ලද කතිකාවත මේ වනවිට අඩපණ වී තිබුණු නිසා මේ රජු විසින් ද යළිත් කතිකාවතක් සකසන ලදි. එය රාජ්‍යයට පත් වී හත්වන අවුරුද්දෙහි කරන ලද්දකි.[25] ස්වකීය ආචාර්යයන් වූ මොරතොට ශ්‍රී ධම්මක්ඛන්ධ මාහිමියන් ''රාජගුරු'' යන නාමයෙන් ද හැඳින්වීය. පාලි, සංස්කෘත, සිංහල භාෂාවන් හි හා ශබ්ද ශාස්ත්‍රයන් හි මනා දැනුමක් ලැබූ මොහු විසින් අසදෘශ ජාතකය සිංහල කවියට නඟා අසදිසදා කව නම් ග්‍රන්ථයක් රචනා කළේය.[26] ඒ අනුව කෝට්ටේ සිටි vi පරාක්‍රමබාහු රජුගෙන් පසුව රජ්‍යයට පත් වූ මෙතුමා රජවරුන්ගෙන් ග්‍රන්ථ කරණයේ නියැළුණු එක ම රජතුමා ලෙස හැඳින්විය හැකිය. දළදා වහන්සේ උදෙසා පවත්වන ලද සියලුම පුද පූජා ද ඒ ආකාරයෙන් ම පැවැත්වීය. කඨිනයෙහි ආනිශංස පිළිබඳ ව දැනගත් මොහු වර්ෂයක් පාසා කඨින චීවර පූජා පවත්වා ඇත. එසේම බුදුරජුන්ගේ ලෝහමය ප්‍රතිමාවක් හා චෛත්‍යයක් ගංගාරාම විහාරස්ථානයේ සාදා ඇත.[27]

බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ලක්දිව රාජ්‍යයට ඇතුල් වීම හා ලන්දේසීන්ට එරෙහිව යුද ප්‍රකාශ කරන්නට යෙදුනෙ මේ රජුගේ කාලවකවානුවේය. ''ජෝන් පයිබස්'' නමින් හැඳින් වූ තානාපති මෙරටට පැමිණ ලන්දේසීන්ට විරුද්ධව රජයට සහයෝගය දෙන බව කීවත් එම පොරොන්දුව ඉටු කර නොමැත. එම නිසා ඉන්පසුව පැමිණි ඉංග්‍රීසි ජාතිකයන් කෙරෙහි කිසිදු විශ්වාසක් තැබීමට මේ රජුගේ කාලයේ ඉඩක් නොවීය. කෙසේ වෙතත් ක්‍රි. ව. 1795 දී ත්‍රිකුණාමලය වරාය ස්ටුවර්ට් නැමති ඉංග්‍රීසි ජාතිකයෙකු විසින් අල්වාගෙන ඇත. මෙය ලන්දේසීන්ගේ පාලනය නැති වී ඉංග්‍රීසින්ගේ පාලනයට යටත් වීමේ මුලාරම්භය විය.[28] කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ ප්‍රවර උපාලි හිමියන්ගේ මූලිකත්වයෙන් පිහිටුවන ලද බද්ධ සීමාව ජරාවාස වී තිබුණ නිසා ප්‍රතිසංස්කරණ කටයුතු මෙතුමාගේ කාලයේ සිදුවිය.

රාජාධිරාජසිංහ රජුගේ ඇවෑමෙන් ඔහුගේ බිසවගේ සහෝදරියකගේ පුතෙක් වූ කණ්ණසාමි නම් කුමරා ශ්‍රී වික්‍රම රාජසිංහ (ක්‍රි. ව. 1798 - 1815) යනුවෙන් උඩරට රාජ්‍යයට පත්විය. මොහු රාජ්‍යයට පත් කිරීමට මූලිකව කටයුතු සිදු කරන ලද්දේ පිළිමතලව්වේ නමින් හැඳින් වු අදිකාරම් තැනය. එහෙත් පිළිමතලව්වේ රාජ්‍යයට දැඩි ලෝභයෙන් යුක්තව සිටි කෙනෙකි. මෙම අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා නිතරම උත්සහ ගත් හෙතෙම ලංකාවට පැමිණි ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා වූ ෆෙඩ්රික් නෝර්ත් සමඟ රහසිගත සම්බන්ධතාවයක් ගොඩ නඟා ගත්තේ නමුත් ඒ සියල්ල ව්‍යයර්ථ විය. මින් පසු රජුගේ ජීවිතය අවදානම් තත්වයක පැවති අතර ඊට විරුද්ධව නැගී සිටීමට ඔහුට බලයක් නොවීය.[29] ක්‍රි. ව. 1805 දී නෝර්ත් ලංකාව හැරගිය අතර රොබට් බ්‍රවුන්රිග් එම ධුරයට පති වී ඇත. ඉන්පසු රජු මැරීමට තැත් කිරීමේ වරදට පිළිමතලව්වේ අදිකාරම් ක්‍රි. ව. 1812 දී හිස ගසා මරවන ලදි. ඉන්පසු එම තනතුරට පත් වූයේ ඔහුගේ බෑණා වූ ඇහැලේපොළ අදිකාරම්ය. ඔහු ද රජුට විරුද්ධව කැරැල්ලක් දියත් කළේය. මේ හේතු කොට ගෙන රජු ඔහුගේ භාර්යාව ඇතුළු දරුවන් හිස ගසා මරවන ලදි. වීර මද්දුම බණ්ඩාර මොහුගේ එක් පුතෙකි. මීට විරෝධය පෑමක් වශයෙන් රට වැසියා ද එකතු කොට ඉංග්‍රීසීන්ගේ උපකාර ඇතිව ඇහැලේපොළ කැරැල්ලක් දියත් කොට රජු සිර භාරයට ගත්තේය. ඒ ක්‍රි. ව. 1815 මාර්තු මස 02 දින දී ය. එහෙත් ඇහැළේපොල තමාගේ අභිප්‍රාය පරිදි කටයුතු සිදු නොකළ අතර ලක් රාජ්‍ය බ්‍රිතාන්‍යයන්ට භාරදුනි.[30] මෙයින් නායක්කර් වංසය මෙන් ම ලක්දිව රාජාවලිය ද නිමාවට පත් විය. ඒ අනුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමස්ත රාජාවලියේ අවසන් රජු විය.

මෙම රජුගේ කාලයේ රටේ පැවති අවුල් සහගත තත්වය නිසා රජු නිතර ම පසුවූයේ කළකිරීමෙනි. එම නිසා ශාසනය උදෙසා දැකිවිය යුතු රාජ්‍ය අනුග්‍රහය ද ලැබුණේ මඳ වශයෙනි. අනෙක් රජවරුන්ට මෙන් එවැනි කාර්යයන් ඉටු කිරීමට නොහැකි වූ නිසා රජුගේ රාජ්‍යය ද අස්ථාවර විය. රජු නිතර ම මත්පැන් ආදිය පානය කිරීමට පෙළඹී සිටියේය. කෙසේ නමුත් දළදා වහන්සේ උදෙසා ඉටුකළයුතු වතිවත් හා පැවැත්විය යුතු පුද පූජාවන් ද මහාසංඝරත්නයට දන්දීමාදි කටයුතු හැකි පමණින් ඉටු කර ඇති බව සඳහන් වේ.[31]

ආන්තික සටහන්

---

[1] ම. ව., පරි. 7, ගා. 47, පි. 41.

[2] -එම-, පරි. 10, ගා. 76, පි. 59.

[3] -එම-, පරි. 78, ගා. 58, පි. 522.

[4] රාජාවලිය, (සංස්.) ඒ. වී. සුරවීර, පි. 219.

[5] සන්නස්ගල, පුංචිබණ්ඩාර, සිංහල සාහිත්‍ය වංශය, පි. 438.

[6] සන්නස්ගල, පුංචිබණ්ඩාර, සිංහල සාහිත්‍ය වංශය, පි. 438. හා
මන්දාරම්පුර පුවත, (සංස්.) ලබුගම ලංකානන්ද හිමි, 519 -521 කවි පි.

[7] Rahula, Walpola, History of Buddhism in Ceylon, pp. 63

[8] ම. ව., පරි. 96, ගා. 2 - 4, පි. 595.

[9] ම. ව., පරි. 96, ගා. 65, 85 පි. 600, 602

[10] ස්‍යාමොපසම්පදාවත. (සංස්.) හංගමුවේ සිරි රතනාලංකාර හිමි, පි. 53.

[11] මලලසේකර, ජී. පී. ලංකා පාලි සාහිත්‍ය, පි. 207.

[12] ම. ව., පරි. 97, ගා. 2, පි. 603.

[13] මන්දාරම්පුර පුවත, (සංස්) ලබුගම ලංකානන්ද හිමි, 594 පද්‍යය, පි. 78

[14] ස්‍යාමොපසම්පදාවත. (සංස්.) හංගමුවේ සිරි රතනාලංකාර හිමි, පි. 50.

[15] ස්‍යාමොපසම්පදාවත. (සංස්.) හංගමුවේ සිරි රතනාලංකාර හිමි, පි. 56 -71.

[16] ස්‍යාමොපසම්පදාවත. (සංස්.) හංගමුවේ සිරි රතනාලංකාර හිමි, පි. 65.

[17] මන්දාරම්පුර පුවත, (සංස්) ලබුගම ලංකානන්ද හිමි, 718 -720, පද්‍යය, පි. 95

[18] පියසේන. ඒ. ජී. මහනුවර යුගයේ පාලි සාහිත්‍යය, පි. 7.

[19] ශ්‍රී බුද්ධ වර්ෂ 2294 (1752) නිකිණි මස පුර දොළොස්වක් ලත් බදාදා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් ස්වකීය රාජෝද්‍යයෙන් සිව් වැන්නෙහි ශ්‍රී පාදස්ථානයේ පුදපූජා සත්කාර පැවැත්වීම හා එහි වත් පිළිවෙත් පිරිමැසීමත් කරණ සංඝයාගේ ප්‍රයෝජනය තකා මුල් බිජු එක්සිය හැටපස් අමුනේ වපසරියත් එහි බද ගෙවතු ගහකොල ගොඩමඩ ඇතුළු කුට්ටාපිටිය ගම සහිත ශ්‍රී පාදස්ථානය වැලිවිට සරණංකර සාමීන්ගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරානුගතව පුද පවත්වන ලෙස භාර කිරීම සඳහා මේ සන්නස දෙන ලදි.

ඥාණවිමල හිමි, කිරිඇල්ලේ, සපරගමුවේ පැරණි ලියවිලි, පි. 12.

[20] ඥාණවිමල හිමි, කිරිඇල්ලේ, සපරගමුවේ පැරණි ලියවිලි, පි. 17.

[21] ම. ව., පරි. 99, ගා. 117 - 144, පි. 611 - 613.

[22] මහනුවර තොරතුරු, වාරියපොල ශ්‍රී සුමංගල විද්‍යාලයීය ශාස්ත්‍රිය සංග්‍රහය, පි. 59

[23] Codrington, H. W., .A Short Story of Ceylon, pp. 145

[24] ධර්මකීර්ති හිමි, නිවන්දම, ශාසනික ඉතිහාසය, පි. 163.

[25] කතිකාවත් සඟරා (සංස්.) ඩී. බී. ජයතිලක, පි. 28.

[26] ම. ව., පරි. 99, ගා. 12 -13, පි.

[27] ම. ව., පරි. 99, ගා. 15 -18, පි. 637.

[28] දිසානායක, සුජීව, ලංකාවේ ලන්දේසි, (පරි.), පි. 92.

[29] මලලසේකර, ජී. පී. ලංකා පාලි සාහිත්‍ය, පි. 217.

[30] මලලසේකර, ජී. පී. ලංකා පාලි සාහිත්‍ය, පි. 218.

[31] ම. ව., පරි. 99, ගා. 20් 23, පි. 637.